# ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය

# ගෝලීය සත්කාරක අධ්‍යාපනයේ දේශීය සන්නාමය හොබවන අපගේ විශිෂ්ඨ සාමාජිකයකු වන්න

## 01. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (AR 2 කාණ්ඩය) - පුරප්පාඩු 09

| අධ්‍යයන අංශය | තනතුරු සංඛ්‍යාව | පුරප්පාඩු පවතින පාසල/ල් |
|---|---|---|
| ගෘහ පාලනය (Housekeeping) | 01 | මහනුවර |
| අමුත්තන් පිළිගැනීමේ අංශය (Front Office) | 01 | බණ්ඩාරවෙල |
| ආහාර හා පාන කළමනාකරණය (Food & Beverage) | 01 | අනුරාධපුර |
| වෘත්තීය සූපවේදය (Professional Cookery) | 03 | කොළඹ, මහනුවර, කොග්ගල |
| පේස්ට්‍රි සහ බේකරි අංශය (Pastry & Bakery) | 01 | කොළඹ |
| චාරිකා හා සංචරණය (Travel & Tourism) | 01 | මහනුවර |
| ඉංග්‍රීසි අංශය (English) | 01 | කොළඹ |

**සුදුසුකම්:**

**බාහිර අයදුම්කරුවන් - (පහත 1 හෝ 2 හෝ 3):**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, සංචාරක ව්‍යාපාරය සහ ආගන්තුක සත්කාර කළමනාකරණය පිළිබඳ විශේෂ උපාධියක්/ භාෂා උපාධියක් (ඉංග්‍රීසි භාෂාව පිළිබඳ විශේෂ උපාධියක්)

   **සමග**

   සංචාරක ව්‍යාපාරය සහ ආගන්තුක සත්කාර කළමනාකරණය පිළිබඳ පශ්චාත් (දර්ශනපති) උපාධියක් සුදුසුකම් (Masters Degree)

   **සහ**

   පළමු උපාධිය ලබා ගැනීමෙන් පසු, අධ්‍යාපනික ආයතනයක හෝ තරු තුන හෝ ඉහළ වර්ගීකරණය සහිත හෝටලයක අවම වශයෙන් වසර 08 ක පළපුරුද්ද, රජයේ සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පුද්ගලික ආයතනයක විධායක මට්ටමේ පළපුරුද්ද.

2. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, සංචාරක ව්‍යාපාරය සහ ආගන්තුක සත්කාර කළමනාකරණය පිළිබඳ උපාධියක් / භාෂා උපාධියක් (ඉංග්‍රීසි භාෂාව පිළිබඳ විශේෂ) සමග අදාළ ක්ෂේත්‍රයේ ආචාර්ය (PhD) උපාධියක් තිබීම

   **සහ**

   පළමු උපාධිය ලබාගැනීමෙන් පසු, අධ්‍යාපනික ආයතනයක හෝ තරු තුන හෝ ඉහළ වර්ගීකරණය සහිත හෝටලයක අවම වශයෙන් වසර 05 ක පළපුරුද්ද, රජයේ සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පුද්ගලික ආයතනයක විධායක මට්ටමේ පළපුරුද්ද.

3. ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ (SLITHM) වෘත්තීය සූපවේදය / ආහාර හා පාන කළමනාකරණය /අමුත්තන් පිළිගැනීමේ අංශය/ හෝටල් ගෘහපාලනය පිළිබඳ හෝ අදාළ ක්ෂේත්‍රයේ විශේෂඥතාව සහිත පූර්ණ උපාධිධාරියකු වීම සමග සංචාරක ව්‍යාපාරය / ආගන්තුක සත්කාර කළමනාකරණය පිළිබඳ පශ්චාත් (දර්ශනපති) උපාධි (Masters) සුදුසුකම් තිබීම.

   **සහ**

   ඉගැන්වීම සහ / හෝ පුහුණු කිරීමේ හා මානව සම්පත් සංවර්ධන ක්‍රියාකාරකම්හි සෘජුව නියැලීමේ අවම වසර 05 ක පළපුරුද්ද ඇතුළුව ආගන්තුක සත්කාර ක්ෂේත්‍රය පිළිබඳ කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 12 ක පළපුරුද්ද තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2 හෝ 3)**

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් විසින් සපුරාලිය යුතු සුදුසුකම් ලබා තිබීම.

   **හෝ**

2. SLITHM හි අධ්‍යයන/පර්යේෂණ කාණ්ඩයේ (AR1) I ශ්‍රේණියේ "කථිකාචාර්ය" ලෙස අවම වශයෙන් අවුරුදු පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

   **හෝ**

3. ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ පූර්ණ සුදුසුකම්ලත් උපාධිධාරියෙකු වීම හා පශ්චාත් (දර්ශනපති) උපාධිය (Masters) සමග අධ්‍යයන/පර්යේෂණ කාණ්ඩයේ (AR1) "සහකාර කථිකාචාර්ය" ලෙස අවුරුදු 10 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

- **වැටුප් පරිමාණය :** AR 2 – 2025 රු. [133,220 – 10 X 3600 =169,220/–]
- **වැටුප :** කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 01/2025 පරිදි මූලික වැටුප සමග ජීවන වියදම් දීමනාව සහ රජයේ අනුමත අනෙකුත් දීමනා ද ගෙවනු ලැබේ. ඊට අමතරව මාසික වෘත්තීය දීමනාවක් හා දුරකථන දීමනාවක් ගෙවනු ලැබේ. ප්‍රවාහන පහසුකම් හෝ ප්‍රවාහන/ ඉන්ධන දීමනාවක් ගෙවනු ලැබේ.
- **වයස :** වයස අවුරුදු 30 ට නොඅඩු සහ අවුරුදු 55ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

## 2. කථිකාචාර්ය/සහකාර කථිකාචාර්ය (AR 1 කාණ්ඩය) - පුරප්පාඩු - 11

| අධ්‍යයන අංශය | තනතුරු සංඛ්‍යාව | පුරප්පාඩු පවතින පාසල/ල් |
|---|---|---|
| ගෘහ පාලනය (Housekeeping) | 01 | කොළඹ |
| අමුත්තන් පිළිගැනීමේ අංශය (Front Office) | 02 | කොළඹ, අනුරාධපුර |
| ආහාර හා පාන කළමනාකරණය (Food & Beverage) | 03 | කොළඹ, බණ්ඩාරවෙල, මඩකලපුව |
| වෘත්තීය සූපවේදය (Professional Cookery) | 04 | කොළඹ, මහනුවර, බණ්ඩාරවෙල, අනුරාධපුර |
| චාරිකා හා සංචරණය (Travel & Tourism) | 01 | කොළඹ |

**සුදුසුකම්:**

**බාහිර අයදුම්කරුවන් - (පහත 1 හෝ 2 හෝ 3):**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, සංචාරක ව්‍යාපාරය සහ ආගන්තුක සත්කාර කළමනාකරණය පිළිබඳ විශේෂ උපාධියක්/ භාෂා උපාධියක් (ඉංග්‍රීසි භාෂාව පිළිබඳ විශේෂ උපාධියක්)
2. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සංචාරක ව්‍යාපාරය සහ ආගන්තුක සත්කාර කළමනාකරණය පිළිබඳ සාමාන්‍ය උපාධියක්/ භාෂා උපාධියක් (ඉංග්‍රීසි භාෂාව පිළිබඳ විශේෂ) සමග අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක්
3. ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ (SLITHM) වෘත්තීය සූපවේදය/ ආහාර හා පාන කළමනාකරණය/ අමුත්තන් පිළිගැනීමේ අංශය/ හෝටල් ගෘහපාලනය පිළිබඳ විශේෂඥතාව සමග පූර්ණ උපාධිධාරියකු වීම.

   **සහ**

   පළමු උපාධිය ලබා ගැනීමෙන් පසු, තරුතුනේ හෝ ඉහළ වර්ගීකරණය ලද හෝටලයක විධායක ශ්‍රේණියේ අවම වශයෙන් වසර 02ක පළපුරුද්ද.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් විසින් සපුරාලිය යුතු සුදුසුකම් ලබා තිබීම.

- **වැටුප් පරිමාණය :** AR 1 – 2025 රු. [91,650–10 X 2480–15X3450=168,200/–]
- **වැටුප :** කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 01/2025 පරිදි මූලික වැටුප සමග ජීවන වියදම් දීමනාව සහ රජයේ අනුමත අනෙකුත් දීමනා ද ගෙවනු ලැබේ. ඊට අමතරව මාසික වෘත්තීය දීමනාවක්, දුරකථන හා ප්‍රවාහන දීමනා ගෙවනු ලැබේ.
- **වයස :** වයස අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

## 03. සහකාර අධ්‍යක්ෂ - මානව සම්පත් සහ පරිපාලනය (MM 1 – 2 කාණ්ඩය)

**01 පුරප්පාඩු - කොළඹ**

**සුදුසුකම් :**

**බාහිර අයදුම්කරුවන්**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් මානව සම්පත් කළමනාකරණය පිළිබඳ උපාධියක් ලබා තිබීම.

   **සහ**

   රාජ්‍ය සේවයේ/ සංස්ථාවක / ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක, පරිපාලන හා මානව සම්පත් කළමනාකරණ ක්ෂේත්‍රයේ, කළමනාකරණ මට්ටමේ, අවම වශයෙන් වසරක පශ්චාත් වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් විසින් සපුරාලිය යුතු සුදුසුකම් ලබා තිබීම.
2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ කණිෂ්ඨ කළමනාකරු (JM) කාණ්ඩයේ තනතුරක අවම වශයෙන් අවුරුදු පහක් (5) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

## 04. සහකාර අධ්‍යක්ෂ - තොරතුරු තාක්ෂණ (MM 1 – 2 කාණ්ඩය) 01 පුරප්පාඩු - කොළඹ

**සුදුසුකම් :**

**බාහිර අයදුම්කරුවන්**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් තොරතුරු තාක්ෂණය පිළිබඳ උපාධියක් ලබා තිබීම.

   **සහ**

   රාජ්‍ය සේවයේ/ සංස්ථාවක/ ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසරක පශ්චාත් වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් විසින් සපුරාලිය යුතු සුදුසුකම් ලබා තිබීම.
2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ කනිෂ්ඨ කළමනාකරු (JM) කාණ්ඩයේ තනතුරක අවම වශයෙන් අවුරුදු පහක් (5) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

## 05. සහකාර ලේඛකාධිකාරී (MM 1 – 2 කාණ්ඩය) 01 පුරප්පාඩු - කොළඹ

**සුදුසුකම් :**

**බාහිර අයදුම්කරුවන්**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් පරිපාලන, කළමනාකරණ, සංචාරක, අධ්‍යාපනය හෝ ඒ ආශ්‍රිත සමාජ විද්‍යාව පිළිබඳ උපාධියක්

   **සහ**

   රාජ්‍ය සේවයේ/ සංස්ථාවක/ ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක පරිපාලන, කළමනාකරණ, සංචාරක, අධ්‍යයන හෝ ඒ ආශ්‍රිත සමාජ විද්‍යා ක්ෂේත්‍රයේ විධායක මට්ටමේ අවම වශයෙන් වසරක පශ්චාත් වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් විසින් සපුරාලිය යුතු සුදුසුකම් ලබා තිබීම.
2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ කනිෂ්ඨ කළමනාකරු JM කාණ්ඩයේ තනතුරක අවම වශයෙන් අවුරුදු පහක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**ඉහත 3, 4 සහ 5 තනතුරු සඳහා අදාළ පොදු කරුණු පහත පරිදි වේ.**

- **වැටුප් පරිමාණය :** MM 1-2– 2025 රු. [94,170 –10X2480 –15X3450=170,720/–]
- **වැටුප :** කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 01/2025 පරිදි මූලික වැටුප සමග ජීවන වියදම් දීමනාව සහ රජයේ අනුමත අනෙකුත් දීමනා ද ගෙවනු ලැබේ. ඊට අමතරව මාසික වෘත්තීය දීමනාවක්, දුරකථන හා ප්‍රවාහන දීමනා ගෙවනු ලැබේ.
- **වයස :** අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

## 6. පේස්ට්‍රි සහ බේකරි නිලධාරී (Pastry and Bakery Officer) (JM 1 – 2 කාණ්ඩය) 01 පුරප්පාඩු - කොළඹ

**සුදුසුකම් :**

**බාහිර අයදුම්කරුවන් (පහත 1 හෝ 2 )**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සංචාරක/ ආගන්තුක සත්කාර කළමනාකරණය පිළිබඳ උපාධියක්

   **හෝ**

2. ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ (SLITHM) වෘත්තීය සූප වේදය පිළිබඳ විශේෂඥතාවක් සහිත පූර්ණ උපාධිධාරියෙකු වීම හෝ පේස්ට්‍රි සහ බේකරි පිළිබඳ ඩිප්ලෝමාවක සුදුසුකම් ලැබීමෙන් පසු වසර 02 ක වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2 )**

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් විසින් සපුරාලිය යුතු සුදුසුකම් ලබා තිබීම.
2. කළමනාකරණ සහකාර–තාක්ෂණික නොවන (MA 1-2) II ශ්‍රේණියේ තනතුරක, තනතුරට අදළ විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් අවුරුදු පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කිරීම.

## 7. ලොන්ඩ්‍රි මෙහෙයුම් නිලධාරී (Laundry Operating Officer) (JM 1 – 2 කාණ්ඩය) 01 පුරප්පාඩු - කොළඹ

**සුදුසුකම්:**

**බාහිර අයදුම්කරුවන් (පහත 1 හෝ 2 )**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සංචාරක/ ආගන්තුක සත්කාර කළමනාකරණය හෝ ඒ ආශ්‍රිත සමාජ විද්‍යාව පිළිබඳ උපාධියක්

   **හෝ**

2. ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ (SLITHM) හෝටල් ගෘහපාලනය පිළිබඳ විශේෂඥතාව සහිත පූර්ණ උපාධිධාරියෙකු වීම සහ සුදුසුකම් ලැබීමෙන් පසු වසර 02 ක වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2 )**

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් විසින් සපුරාලිය යුතු සුදුසුකම් ලබා තිබීම.
2. කළමනාකරණ සහකාර–තාක්ෂණික නොවන (MA 1-2) II ශ්‍රේණියේ තනතුරක, තනතුරට අදළ විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් අවුරුදු පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කිරීම.

**ඉහත 6 සහ 7 තනතුරු සඳහා පොදු කරුණු පහත පරිදි වේ.**

- **වැටුප් පරිමාණය :** JM 1-2 – 2025 රු. [74,010–10X1360–18X2040 =124,330/–]
- **වැටුප :** කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 01/2025 පරිදි මූලික වැටුප සමග ජීවන වියදම් දීමනාව සහ රජයේ අනුමත අනෙකුත් දීමනා ද ගෙවනු ලැබේ. ඊට අමතරව දුරකථන දීමනාවක් හා ප්‍රවාහන දීමනා ගෙවනු ලැබේ.
- **වයස :** අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

## 08. කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන (MA 1–2 කාණ්ඩය) 02 පුරප්පාඩු - කොළඹ

**සුදුසුකම් :**

**බාහිර අයදුම්කරුවන්**

a) අ.පො.ස.(සා/පෙළ) විභාගයෙන් එක්වරකදී පහත විෂයන් ඇතුළුව විෂයන් 04කට සම්මාන සාමාර්ථ සහිතව විෂයන් 06 ක් සමත්ව තිබිම.

   i. සිංහල/දෙමළ
   ii. ඉංග්‍රීසි භාෂාව
   iii. ගණිතය

**සහ**

අ.පො.ස.(උ/පෙළ) විභාගය විෂයන් තුනක් (03) (පොදු පරීක්ෂණයට හැර) සමත්ව තිබිම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති ප්‍රාථමික සේවා ගණයේ කුසලතා මට්ටමේ, අර්ධ කුසලතා මට්ටමේ, හා නුපුහුණු කුසලතා මට්ටමේ නිලධාරීන්හට අයදුම් කිරීමට සුදුසුකම් ලැබේ.

**අධ්‍යාපනික :**

අ.පො.ස.(සා/පෙළ) විභාගයෙන් පහත විශයන් ඇතුළුව විෂයන් 04කට සම්මාන සාමාර්ථ සහිතව විෂයන් 06 ක් සමත්ව තිබීම.

   i. සිංහල / දෙමළ
   ii. ඉංග්‍රීසි භාෂාව
   iii. ගණිතය

- **වෙනත් :** ඉහත සේවා ගණයේ ස්ථිර තනතුරක අවම වශයෙන් වසර 05ක සතුටුදායි සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
- **වැටුප් පරිමාණය :** MA1-2–2025 රු. [46,220–10X540–7X630–12X1080–12X1280 =84,350/–]
- **වැටුප :** කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 01/2025 පරිදි මූලික වැටුප සමග ජීවන වියදම් දීමනාව සහ රජයේ අනුමත අනෙකුත් දීමනා ද ගෙවනු ලැබේ. ඊට අමතරව ප්‍රවාහන දීමනා ගෙවනු ලැබේ.
- **වයස :** අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

## 09. රියදුරු (PL 3 කාණ්ඩය) - 01 පුරප්පාඩු - කොළඹ

**සුදුසුකම්:**

**බාහිර අයදුම්කරුවන්**

අ.පො.ස.(සාමාන්‍ය පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී අවම වශයෙන් විෂයන් 02 ක් සමග සම්මාන සාමාර්ථ සහිතව විෂයන් 06 කින් සමත්ව තිබීම.

**සහ**

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද බරවාහන රියදුරු බලපත්‍රයක් සහිත විම හා එම රියදුරු බලපත්‍ර ලබාගැනීමෙන් පසු රියදුරකු ලෙස අවම වශයෙන් වසර තුනක (03) ක පළපුරුද්ද සහිත වීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද බරවාහන රියදුරු බලපත්‍රයක් සහිත විම හා එම රියදුරු බලපත්‍ර ලබාගැනීමෙන් පසු රියදුරකු ලෙස අවම වශයෙන් වසර තුනක (03) ක පළපුරුද්ද සහිත වීම.

**සහ**

ප්‍රාථමික සේවා ගණයේ අර්ධ කුසලතා මට්ටමේ (PL 2) හෝ නුපුහුණු කුසලතා මට්ටමේ (PL 1) අවම වශයෙන් වසර 5 ක සතුටුදායි සේවා පළපුරුද්දක් සම්පූර්ණ කර තිබීම.

- **වැටුප් පරිමාණය :** PL3 – 2025 රු.[43,280– 10X 490– 10X 540– 10X 590–12X630=67,040/–]
- **වැටුප :** කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 01/2025 පරිදි මූලික වැටුප සමග ජීවන වියදම් දීමනාව සහ රජයේ අනුමත අනෙකුත් දීමනා ද ගෙවනු ලැබේ. ඊට අමතරව ප්‍රවාහන දීමනා ගෙවනු ලැබේ.
- **වයස :** වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

## 10. Comics - පේස්ට්‍රි සහ බේකරි (PL 2 කාණ්ඩය) 02 පුරප්පාඩු - කොළඹ

**සුදුසුකම්:**

**බාහිර අයදුම්කරුවන්**

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද, වෘත්තීය සූපවේදය / පේස්ට්‍රි සහ බේකරි ක්ෂේත්‍රයේ ජාතික වෘත්තීය සුදුසුකම් 2 වන මට්ටමට (NVQ 2) නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**සහ**

රාජ්‍ය සේවයේ, සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක වසර 01 ක පශ්චාත් වෘත්තීය පළපුරුද්දක් තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් විසින් සපුරාලිය යුතු සුදුසුකම් ලබා තිබීම.
2. වෘත්තීය පරීක්ෂණයකින් සනාථ කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් 2 වන මට්ටමට නොඅඩු කුසලතා සහිතව අදාළ ක්ෂේත්‍රයේ ප්‍රථමික සේවා ගණයේ නොපුහුණු කුසලතා මට්ටමේ අවම වශයෙන් අවුරුදු පහක (05) සේවා පළපුරුද්දක් සම්පූර්ණ කර තිබීම.

## 11. ලොන්ඩ්‍රි අධීක්ෂක (Laundry Supervisor) (PL 2 කාණ්ඩය) 01 පුරප්පාඩු - කොළඹ

**සුදුසුකම් :**

**බාහිර අයදුම්කරුවන්**

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද, හෝටල් ගෘහ පාලනය/ ලොන්ඩ්‍රි කළමණාකරණය පිළිබඳ ජාතික වෘත්තීය සුදුසුකම් 2 වන මට්ටමට (NVQ 2) නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**සහ**

රාජ්‍ය සේවයේ, සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක වසර 01 ක පශ්චාත් වෘත්තීය පළපුරුද්දක් තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් විසින් සපුරාලිය යුතු සුදුසුකම් ලබා තිබීම.
2. වෘත්තීය පරීක්ෂණයකින් සනාථ කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් 2 වන මට්ටමට නොඅඩු කුසලතා සහිතව අදාළ ක්ෂේත්‍රයේ ප්‍රාථමික සේවා ගණයේ නුපුහුණු කුසලතා මට්ටමේ අවම වශයෙන් අවුරුදු පහක (05) සේවා පළපුරුද්දක් සම්පූර්ණ කර තිබීම.

**ඉහත 10 සහ 11 තනතුරු සඳහා අදාළ පොදු කරුණු පහත පරිදි වේ.**

- **වැටුප් පරිමාණය :** PL2–2025 රු.[42,300–10X490–10X540–10X590–12X630=66,060/–]
- **වැටුප :** කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 01/2025 පරිදි මූලික වැටුප සමග ජීවන වියදම් දීමනාව සහ රජයේ අනුමත අනෙකුත් දීමනා ද ගෙවනු ලැබේ. ඊට අමතරව ප්‍රවාහන දීමනාවක් ගෙවනු ලැබේ.
- **වයස :** වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

## 2. කාර්යාල සහායක (PL 1 කාණ්ඩය) 01 පුරප්පාඩුව - කොළඹ

**සුදුසුකම්:**

**බාහිර අයදුම්කරුවන්**

අ.පො.ස. (සා.පෙළ) විභාගයට පෙනී සිට එකවර සම්මාන දෙකක් සහිතව විෂයයන් හයක් (06) සමත්ව තිබීම.

## 13. ලොන්ඩ්‍රි ක්‍රියාකරු (Laundry Operator) (PL 1 කාණ්ඩය) 02 පුරප්පාඩු - කොළඹ

**සුදුසුකම්:**

**බාහිර අයදුම්කරුවන්**

අ.පො.ස. (සා.පෙළ) විභාගයට පෙනී සිට එකවර සම්මාන දෙකක් සහිතව විෂයයන් හයක් (06) සමත්ව තිබීම.

**ඉහත 12 සහ 13 තනතුරු සඳහා අදාළ පොදු කරුණු පහත පරිදි වේ.**

- **වැටුප් පරිමාණය :** PL1–2025 රු. [40,500–10X450–10X490–7X540–15X590 = 62,530/–]
- **වැටුප :** කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 01/2025 පරිදි මූලික වැටුප සමග ජීවන වියදම් දීමනාව සහ රජයේ අනුමත අනෙකුත් දීමනා ද ගෙවනු ලැබේ. ඊට අමතරව ප්‍රවාහන දීමනා ගෙවනු ලැබේ.
- **වයස :** වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**අනෙකුත් තොරතුරු**

**සෑම අයදුම්කරුවකුම :**

අ. ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.
ආ. තනතුරේ රාජකාරී මැනවින් ඉටුකිරීම සඳහා කායිකව හා මානසිකව යෝග්‍ය විය යුතුය.
ඇ. ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට කැමති විය යුතුය.
ඈ. විශිෂ්ට චරිතයකින් හෙබි විය යුතුය.

**ප්‍රතිලාභ :**

01. සේවක අර්ථසාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදල (EPF හා ETF) සඳහා දයකත්වය
    අ.) සේවක අර්ථසාධක අරමුදලට සේවකයා විසින් ඒකාබද්ධ වැටුපෙන් 10% බැගින්ද සේව්‍යයා විසින් 15% කින්ද දායක වනු ඇත.
    ආ.) සේවක භාරකාර අරමුදලට සේව්‍යයා විසින් වැටුපෙන් 3% කින් දායක වනු ඇත.
02. සේවකයා හා ඔහුගේ/ ඇයගේ පවුල සඳහා ආකර්ෂණීය වෛද්‍ය රක්ෂණ ආවරණයක් හිමිවේ.
03. ප්‍රවාහන දීමනාවක් ගෙවනු ලැබේ.
04. පැයක් ඇතුළත අදළ සේවා ස්ථානය වෙත ළඟා විය හැකි, උසස් පරිගණක සාක්ෂරතාවය සහිත, ද්වි භාෂා හැකියාව (සිංහල/ ඉංග්‍රීසි) සහිත අයදුම්කරුවන්ට ප්‍රමුඛතාවය හිමිවේ.

**අයදුම් කිරීමේ ක්‍රමවේදය :**

සම්පූර්ණ ජීවදත්ත විස්තර සහිත අයදුම්පත්, අධ්‍යාපනික සුදුසුකම්, සේවා පළපුරුද්ද ආදියට අදාළ සියලුම සහතිකවල පිටපත් සහ ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම්ද සහිතව ලිපි කවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර සඳහන් කොට **2025.10.13** වන දින හෝ ඊට පෙර පහත සඳහන් අය වෙත ලියාපදිංචි තැපෑලෙන් ලැබීමට සැලැස්විය යුතුය. තනතුරු එකකට වඩා අයදුම් කරන්නේ නම්, එක් එක් තනතුරු සඳහා වෙන වෙනම අයදුම්පත් එවිය යුතුය.

සැලකිය යුතුයි: යම් අයදුම්කරුවෙකු වෙනුවෙන් ආයතනය වෙත සිදු කෙරෙන සියලු ආකාරයේ බලපෑම් තනතුර සඳහා නුසුදුසුකමක් ලෙස සලකනු ලැබේ.අසම්පූර්ණ, ඉහත අවශ්‍යතා සපුරාලීමට අපොහොසත්වන අයදුම්පත් හා අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**අධ්‍යක්ෂ ජනරාල්,**
**ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය,**
**නො. 78, ගාලු පාර,**
**කොළඹ 03.**

**සාමාන්‍ය විමසීම් : 011 – 2208300 දුරකථන දිගුව 372/303**
**වැඩි විස්තර සඳහා : www.slithm.edu.lk**